# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1869/33 - 2014 ජූලි මස 02 වැනි බදාදා - 2014.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(ඩ) වගන්තිය ප්‍රකාර සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව පනවනු ලබන නියෝගය.

පියංකර ජයරත්න (පා. ම.),
සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2014 ජුනි මස 26 වැනි දින,
කොළඹ 01.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල (බ. ජා. ගු.), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල (ම. රා. ජා. ගු.) සහ රත්මලාන ගුවන්තොටුපලෙහි (ර. ගු.) ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම ගාස්තු 2014.07.01 දින සිට බලාත්මක වේ.

2. මෙම රෙගුලාසි මගින්, ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු සහ ඊට අදාළව දෙනු ලැබ ඇති විශේෂ වට්ටම් සඳහා අදාළ වන වෙනත් රෙගුලාසි අවලංගු කරනු ලැබේ.

3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ රත්මලාන ගුවන්තොටුපල වෙත පැමිණෙන සෑම ගුවන් යානයක්ම පහත දැක්වෙන ගොඩබැසීම් ගාස්තු සහ නැවතුම් ගාස්තු ව්‍යවස්ථාපිත සේවා සපයන්නා වෙත ගෙවිය යුතු ය.

(අ)

| *සියලු ජාත්‍යන්තර ගුවන්යානා සඳහා ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු* | *ගෘහස්ථ ගුවන්යානා සහ පුහුණු ගුවන්යානා සඳහා ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු* |
|---|---|
| ගොඩබැසීම් - එක් ගොඩබැසීමක් සඳහා ගුවන් යානයේ උපරිම ඉගුලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් එකකට හෝ ඉන් කොටසකට එක්සත් ජනපද ඩොලර් 250 අවමයකට යටත්ව, එක්සත් ජනපද ඩොලර් 4 බැගින් ද, | ගොඩබැසීම් - එක් ගොඩබැසීමක් සඳහා ගුවන් යානයේ උපරිම ඉගුලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් එකකට හෝ එහි කොටසකට රුපියල් 3000/- අවමයකට යටත්ව, රුපියල් 300/- බැගින් ද, |
| නැවතුම් - ගොඩ බැසීමෙන් පසු ප්‍රථම පැය තුනක (3) කාලයකට වැඩිමනත්වන සෑම පැය හයක (6) කාලසීමාවක් හෝ ඉන් කොටසක් සඳහා අදාළ ගොඩබැසීම් ගාස්තුවෙන් සියයට දහයක් (10%) | නැවතුම් - ගොඩ බැසීමෙන් පසු ප්‍රථම පැය තුනක (3) කාලයකට වැඩිමනත්වන සෑම පැය තුනක (3) කාලසීමාවක් හෝ ඉන් කොටසක් සඳහා අදාළ ගොඩබැසීම් ගාස්තුවෙන් සියයට දහයක් (10%) |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) පුහුණු ගුවන්යානා සඳහා අය කරනු ලබන්නේ එක් පුහුණුවක් තුළ සිදු කරනු ලබන අවසාන ගොඩබැසීම සඳහා පමණි.

(ඇ) පුහුණු ගුවන්යානා උපකරණ පිවිසුම් කාර්යය පටිපාටියකදී හෝ දෘෂ්‍යමාන පිවිසුමකදී අවසාන පිවිසුම තුළ වූ බණ්ඩනයකදි හෝ සිදු කරනු ලබන 'සංචාරක හෝ ගොඩබැසීමකදී ' ගගන යාත්‍රාංගනයට ගොඩ බැසීමක් සිදු නොවන අවස්ථාවකදී, එය ගොඩබැසීමේ ගාස්තු අය කිරීම සඳහා තනි ගොඩබැසීමක් ලෙස සලකනු ලැබේ.

4. කෙසේ වෙතත් ඉහත අංක '3' හි සඳහන් ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු වෙනුවෙන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල වෙත/වෙතින් මෙහෙයවන්නාවූ පහත දැක්වෙන සීමිත ගුවන් මෙහෙයුම්කරුවන් වෙත 25%ක විශේෂ වට්ටම් ප්‍රතිශතයක්, මෙම ගැසට් නිවේදනය බලාත්මක දිනයේ සිට වර්ෂ 2016 මාර්තු මස 17 වන තෙක් ප්‍රදානය කරනු ලැබේ.

සීමිත ගුවන් මෙහෙයුම්කරුවන් වර්ග :

(අ) නව කුලී ගුවන් මෙහෙයුම්කරුවන්
(ආ) නව අඩු පිරිවැය ගුවන්සේවා සපයන ගුවන් සමාගම්
(ඇ) නව ගුවන් ගමන් වාර වැඩිකරගන්නා ලද පවත්නා අඩු පිරිවැය ගුවන්සේවා
(ඈ) නව ගුවන් ගමන් වාර වැඩිකරගන්නා ලද පූර්ණ සේවා සපයන ගුවන්සේවා
(ඉ) නව පූර්ණ සේවා සපයන ගුවන්සේවා

*ඉහත සඳහන් ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු සඳහා අදාළ විශේෂ වට්ටම් 2016 මාර්තු මස නැවත සමාලෝචනයට නියමිතය.

5. කෙසේ වෙතත් ඉහත අංක '3' හි සඳහන් ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු වෙනුවෙන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ රත්මලාන ගුවන්තොටුපලට අදාළ ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු සඳහා පහත සඳහන් සහන ප්‍රදානය කරනු ලැබේ.

| ගුවන්තොටුපල | සහන |
|---|---|
| ම. රා. ජා. ගු. | ජාත්‍යන්තර ගොඩබැසීම් සහ නැවතුම්.<br>අවම ගාස්තුව මෙම ගැසට් නිවේදනය බලාත්මක වන දින සිට වර්ෂ 2016 මාර්තු 17 වන තෙක් අදාළ නොවේ. |
| ර. ගු. | ජාත්‍යන්තර ගොඩබැසීම් සහ නැවතුම්.<br>අවම ගාස්තුව මෙම ගැසට් නිවේදනය බලාත්මක වන දින සිට වසර 3ක් සඳහා අදාළ නොවේ |
| | ගෘහස්ථ ගොඩබැසීම් සහ නැවතුම්.<br>ගොඩබැසීම් - රුපියල් 1000/-ක අවමයකට යටත්ව එක් ගොඩබැසීමක් සඳහා ගුවන්යානයේ උපරිම ඉගිලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් එකකට හෝ ඉන් කොටසකට රුපියල් 250/- බැගින්. මෙම සහනය මෙම ගැසට් නිවේදනය බලාත්මක වන දින සිට වසර 3ක් සඳහා අදාළ වේ. |

6. කෙසේ වෙතත් ඉහත ඡේද අංක '3' හි සඳහන් ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු වෙනුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ රත්මලාන ගුවන්තොටුපල සඳහා පහත දැක්වෙන නිදහස් කිරීම් අදාළ වේ.

| නිදහස් කිරීම් |
|---|
| සියලුම පුහුණු ගුවන් යානා අවම ගොඩබැසීම් ගාස්තුවෙන් නිදහස් වේ.<br><br>ඉහත ඡේද අංක '3' හි සඳහන් වන අවම ගාස්තුවෙන් බලපෑමක් සිදුවන නිත්‍ය කාලසටහනකට අනුව ක්‍රියාත්මක වන ලේඛණගත ගුවන්යානා මෙම ගැසට් නිවේදනය බලාත්මක වන දින සිට අවුරුද්දක කාලයක් සඳහා එකී අවම ගාස්තුවෙන් නිදහස් කෙරේ. |

07-496

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.